# භාණක සම්ප්‍රදාය

ගරු අත්තුඩාවේ රාහුල හිමි

මෙකල බුද්ධ ධර්මය ත්‍රිපිටකය යන නමින් හැඳින්වෙතත් බුද්ධකාලයේදී බුද්ධ දේශනාව ධම්ම විනය යන නමින් හැඳින්විණ. බුදු සසුන ද හඳුන්වන ලද්දේ එම වදනිනි. බුද්ධ කාලයේ විනය යන වචනය භාවිත කරන ලද්දේ විනය පිටකය දැක්වීම සඳහා නොවේ. සුත්ත යන පදය සූත්‍ර දැක්වීමට මතු නොව විනය දැක්වීමටද යොදා ගත් බව "සුත්තන්ති විනයො වුතෙතා" යන යෙදීමෙන් පෙනෙයි. ධර්මය පිළිබඳව බෞද්ධ සාහිත්‍යයේ දැක්වෙන මුල්ම බෙදීම ධම්ම විනය යන්නයි. පසුව ශාසනය නවාඞ්ග ශාස්තෘ ශාසන යයි කොටස් නවයකින් යුක්ත වන සේ බෙදා තිබේ. 1. සුත්ත, 2. ගෙය්‍ය, 3. වෙය්‍යාකරණ, 4. ගාථා, 5. උදාන, 6. ඉතිවුත්තක, 7. ජාතක, 8. අබ්භූතධම්ම, 9. වෙදල්ල යන විසිනි. මෙම බෙදීම එතරම් ම පැහැදිලි නැති නිසා වැඩිපුර ව්‍යවහාරයට පැමිණියේද නැත.

සුභද්‍ර නම් බුඪ්ඪපබ්බජිතයාගේ අසංවර ප්‍රකාශය හා නිගණ්ඨ නාතපුත්තගේ අභාවයෙන් ඔහුගේ ශ්‍රාවකයන් අතර ඇතිවූ වාද භේද නිසා බුද්ධ ශාසනයේ චිරස්ථිතිය ගැන සිත යෙදූ මහාකාශ්‍යප හිමියෝ ධර්ම සංගීතියක අවශ්‍යතාව ගැන කල්පනා කළහ. සකස් නොකළ මල් අසුනක් වැනිව පැවති තථාගත ධර්මය විසිමක් අන්දමින් සකස් කොට බුද්ධ ධර්මය ආරක්ෂා කිරීමේ අපේක්ෂාවෙන් බුද්ධ පරිනිර්වාණයෙන් තෙමසකට පසුව මහාකාශ්‍යප හිමියන්ගේ ප්‍රධානත්වයෙන් පන්සියයක් රහතුන් වහන්සේගේ සහභාගිත්වයෙන් රජගහනුවර වේභාර පර්වත ප්‍රාන්තයේ සප්තපර්ණි ගුහාද්වාරයේ තැනූ විශේෂ මණ්ඩපයකදී ප්‍රථම ධර්මසංගායනාව පවත්වන ලදී. එම ධර්ම සංගීතිය පැවැත්වූ අන්දම සුමංගල විලාසිනියෙහි දැක්වෙන පරිදි බුද්ධ ජයන්ති මහාවග්ග පාලි ප්‍රස්තාවනාවෙහි මෙසේ දැක්වෙයි.

### විනය පිටකය

ප්‍රථම සංගීතිකාරක වූ මහරහතුන් විසින් ප්‍රාතිමොක්ෂ ශික්ෂාපදයන් ඇතුළත් අභිවිනය උභතොවිභඞ්ග නමින්ද, අනුඥත ශික්ෂාපදයන් ඇතුළත් අභිවිනය ඛන්ධක නමින්ද, උභතොවිභඞ්ග යෙහි හා ඛන්ධකයන්ගේ අපෝද්ධාරය වූ අභිවිනය පරිවාර නමින්ද, සංගායනා කරන ලදී. ඊට "පයඞාප්ති පාලිය" "භාජනය" යන අර්ථ ඇති පිටක ශබ්දය යොදා විනයපිටක යයි නම් කොට "ඇවැත්නි, මෙය තොප ඇසුරෙහි වූවන් හදරවා ලව" යි උපාලි තෙරණුවන්ට භාර කරන ලදී.

### සුත්තන්ත පිටකය

විනය සඞ්ගායනාවට අනතුරුව ධර්ම සඞ්ගායනාව ආරම්භකළ මහාකාශ්‍යප ස්ථවිරයන් වහන්සේ විසින් බ්‍රහ්මජාල සූත්‍රයෙහි පටන් ඒ ඒ සූත්‍රයන්ගේ නිදාන පුද්ගල ආදිය විචාරනු ලැබූ ධර්ම භාණ්ඩාගාරික ආනන්ද ස්ථවිරයන් වහන්සේ විසින් "එවං මෙ සුතං එකං සමයං භගවා අන්තරා ච රාජගහං අන්තරා ච නාලන්දං අද්ධානමග්ගපටිපන්නොහොති" යන ආදීන් බ්‍රහ්මජාල සූත්‍රයෙහි පටන් එක් එක් සූත්‍රය පිළිබඳ නිදානාදිය දක්වමින් එක් එක් සූත්‍රය විසඳූ පසු මහරහතුන් වහන්සේ විසින් ගණ සජ්ඣායනාකොට ඒ සියලු ධර්ම ශාසන ව්‍යවහාරයෙහි "සමූහය" ලොකව්‍යවහාරයෙහි "නිවාසය" යන අර්ථ ඇති නිකාය ශබ්දය යොදා දීඝ නිකාය ආදි නිකාය පසකට බෙදන ලදී. එහෙයින් කිහ සංගීති පාලියෙහි :—එතෙනෙව උපායෙන පඤ්චපි නිකායෙ පුච්ඡි යි. ඒ ඒ ධර්මයන්ගේ ස්වරූප බලා නිකාය පස මෙසේ නම් කරන ලදී.

(i) දීර්ඝ ප්‍රමාණ ඇති බ්‍රහ්මජාල ආදි සූත්‍ර සූතිසක් (34) ගෙන වර්ග තුනකට බෙද සංග්‍රහකොට ඊට දීඝනිකාය යි නම් තබා එහි බණවර සූසැටක් (64) පමණ වූ පාළිය සජ්ඣායනාකොට (සුමංගල විලාසිනියෙහි කී පරිදි) ඇවැත්නි මෙය පරිහරණය කරවු '' යි ආනන්ද ස්ථවිරයන් වහන්සේට භාර කරන ලදී.

(ii) මධ්‍යම ප්‍රමාණවූ මූලපරියාය ආදි සූත්‍ර එක් සිය දෙපණසක් (152) පණ්ණාස තුනකට හා වර්ග පසළොසකට බෙද සංග්‍රහකොට මජ්ඣිමනිකාය යි නම් තබා එහි බණවර අසූවක් (80) පමණවූ පාළිය සජ්ඣායනා කොට ''ඇවැත්නි, මෙය පරිහරණය කරවු'' යි දම්සෙනෙවි සැරියුත් තෙරණුවන්ගේ අන්තේවාසිකයන්ට පවරන ලදී.

(iii) ඔඝතරණ ආදි සත්දහස් සත්සිය දෙසැටක් (7,762) සූත්‍ර සංයුක්ත වශයෙන් බෙද ඊට සංයුක්ත නිකායයි නම් තබා එහි බණවර (100) පමණ වූ පාළිය සජ්ඣායනාකොට '' ස්වාමීනි, මෙය සිය අතැවැසියන් ලවා හදරණ සේක්වා '' යි මහාකාශ්‍යප ස්ථවිරයන් වහන්සේට භාර කරන ලදී.

(iv) එක් එක් අංගයෙන් වැඩිසිටි චිත්ත පරියාදන ආදි නවදහස් පන්සිය සත් පණසක් (9,557) සූත්‍ර සංග්‍රහකොට ඊට අඞ්ගුත්තර නිකායයි නම් තබා එහි බණවර එක්සිය විස්සක් (120) පමණ වූ පාළිය සජ්ඣායනාකොට '' ඇවැත්නි, මෙය තොප ඇසුරෙහි වූවන් ලවා හදරව '' යි අනුරුද්ධ ස්ථවිරයන් වහන්සේට පවරන ලදී.

(v) ඛුද්දකපාඨ, ධම්මපද, උදාන, ඉතිවුත්තක, සුත්තනිපාත, විමානවත්ථු, පෙතවත්ථු ථේරගාථා, ථේරීගාථා, ජාතක, නිද්දෙස, පටිසම්භිද, අපදාන, බුද්ධවංස, චරියාපිටක යන දේශනා පාළිය සඞ්ගායනාකොට ඛුද්දකනිකාය යන නමින් තබන ලදී. ධර්ම විනය නිකාය පසට පමණක් ඇතුළත් බව සැලකිය යුතුය.

'' මෙතෙකින් ප්‍රථම සංගීති කථාව අවසන් කරන අට්ඨකථාචාර්‍යපාදයෝ මෙසේ කියති ; '' එහි සංගීති පාළියෙහි දක්වූ පඤ්ච නිකාය අතුරෙන් ඛුද්දක නිකාය නම් : දීඝනිකාය ආදි සතර හැර සෙසු බුද්ධ වචනයි. එහි විනය ආයුෂ්මත් උපාලි තෙරුන් විසින් විසඳන ලදී. මුලින් කී නිකාය සතරද සෙසු බුද්ධ වචන සහිත වූ ඛුද්දක නිකාය ද ආයුෂ්මත් ආනන්ද තෙරුන් විසින් විසඳන ලදී.''

ප්‍රථම සංගායනාවේදී බුදධ ධර්මයේ ඒ ඒ කොටස් භාරගත් භික්ෂූන් විසින්ද උන්වහන්සේලාගේ ශිෂ්‍ය පරම්පරාව විසින්ද ඉගෙනීමෙන් කියවීමෙන් තම තමන්ට අයත් කොටස් ආරක්ෂා කර ගන්නා ලදී. ඒ භික්ෂූන් වහන්සේ භාණක යන නමින් හඳුන්වනු ලැබූහ.

දීඝ, මජ්ඣිම, සංයුත්ත අඞ්ගුත්තර යන නිකාය සතරෙහි හා උභතො විභඞ්ගය, ධම්මපද, ජාතක, අරියවංස, මහාවත්තාළිසක යන භාණකයන් ගැන අට්ඨකථාවේ නිතර නිතර සඳහන් වෙයි. ත්‍රිපිටකයේ අන්තර්ගත සියලු ග්‍රන්ථ පිළිබඳව භාණකයන් සිටි බවක් නොදක්වේ.

බුද්ධ පරිනිර්වාණයේ සිට අළුවිහාර සංගීතිය තෙක් අවුරුදු හාරසියයක් පමණ දීර්ඝ කාලයක් තිස්සේ බුදු දහම රැක ගත හැකි වූයේ භාණක සම්ප්‍රදය නිසාය. වාචනා මාර්ගයෙන් බුද්ධ ධර්මය වැනසීයානොදී ආරක්ෂා කරගත හැකිවීම ශාසන ඉතිහාසයේ වැදගත් සිදුවීමකි. යම්කිසි නිකායක භාණකයකුවීමට එම ග්‍රන්ථය මුළුමනින්ම හැදෑරීම අවශ්‍ය නොවන බවට සාධක ලැබී තිබේ. උපසම්පදවෙන් දසවසක්වූ භික්ෂූන් පාලනය කරන භික්ෂුවක විසින් යටත් පිරිසෙයින් දතයුතු සීමාව සමන්තපාසාදිකාවේ මෙසේ සඳහන් වෙයි. විනය පිටකයේ ඇතැම් කොටස් අවශ්‍යයෙන් ම දත යුතුය. එයට අමතර වශයෙන් මජ්ඣිම භාණකයෙක් නම් මජ්ඣිම නිකායේ මූල පණ්ණාසකය දීඝ භාණකයෙක් නම් දීඝ නිකායේ මහාවග්ගය, සංයුක්ත භාණකයෙක් නම් මහාවග්ගයේ මුල් වග්ගතුන, අඞ්ගුත්තර භාණකයෙක් නම් අඞ්ගුත්තර නිකායේ මුල් භාගය එසේ නොහැකි නම් තික නිපාතය දක්වාද, ජාතක භාණකයෙක් නම් අටුවා සහිත ජාතක පෙළද උගත යුතුය.

අඞ්ගුත්තර භාණකයකු විසින් සතරවෙනි නිපාතය හෝ පස්වෙනි නිපාතයත් හදළ යුතුය.

ජාතක භාණකයකු විසින් අතිරේක වශයෙන් ධම්මපදයවත් ඉගෙන ගත යුතුයයි මහාපච්චරි අටුවාව සඳහන් කරතියි බුද්ධඝෝෂ හිමියෝ දක්වති. මුලදී බුදුදහමේ ආරක්ෂාව සඳහා ඇරඹුණු භාණක සම්ප්‍රදය භික්ෂූන් අතර භේද ඇතිවීමට තුඩුදී තිබුණු ආකාරයක් බුද්ධඝෝෂ හිමියන්ගේ

ප්‍රකාශයකින් දක්වෙයි. ගිහියකු භික්ෂූන් වහන්සේ කෙනකු වෙත අවුත් දනයකට ආරාධනා කරමින් දනය සඳහා මහතෙරවරුන් සාමණේරවරුන් මජ්ඣිම භාණකයන් හෝ වෙනත් භාණකයන් මෙපමණ ලබාදෙන්නැයි කීමෙන් එය තහවුරුවන බැව් පැවසෙයි. බුද්ධඝෝෂ හිමියෝ සමන්තපාසාදිකාවේ මෙසේද දක්වති.

නඩුවක් විනිශ්චය කරනු සඳහා භික්ෂුවක් පැමිණි කල ක්ෂත්‍රිය බ්‍රාහ්මණ ආදි වශයෙන් කුලය වත් දීඝභාණක මජ්ඣිම භාණකාදි වශයෙන් ඔහුගේ ආගමවත් නොඇසිය යුතුය. මිහිඳු හිමියන් විසින් ලක්දිවට ගෙන එන ලදුව ලාංකික භික්ෂූන් බාරයේ පැවැති ත්‍රිපිටක පාලිය අටුවා හා ආචාර්‍ය්‍යවාද වාචෝද්ගතකොට ආරක්ෂාකර ගැනීම භාණකයන් විසින් සිදුකොට ඇති මහනීය සේවාවකි. මෙම භාණක සම්ප්‍රදය වසභ රජුගේ රාජ්‍ය සමයතෙක් පැවැතිණැයි සිතිය හැකිය.

**දීඝභාණකයෝ**

දීඝනිකාය හදරා ආරක්ෂා කළ භික්ෂූහු දීඝභාණකයෝය. දීඝභාණක භික්ෂූන් වහන්සේ කෙනකුගේ ශිෂ්‍යයකුට චතුනිකායිකයකු හෝ ත්‍රිපිටක භාණකයකු වීමට බාධාවක් නොවිය. එසේම මජ්ඣිම නිකාය හදරා මජ්ඣිම භාණකයකුවීමටද අවහිරයක් නොවීය. වෙනත් නිකායිකයකුවීම සම්බන්ධවද තත්ත්වය මෙසේය. මහාවිහාරය, මිහින්තලය, කැළණි විහාරය, දීඝභාණක භික්ෂූන් වහන්සේගේ ආයතන ලෙස අටුවාව සඳහන් කරයි. දීඝභාණක අභය, දීඝභාණක මහාසීව යන හිමිවරු අටුවාවේ ඉතා ප්‍රකට හිමිවරු වෙති.

**මජ්ඣිම භාණකයෝ**

මැදුම් සඟිය හදරා එහි ප්‍රවීණත්වය දැරුවෝ මජ්ඣිම භාණකයෝය. මැදුම් සඟිය පරිහරණය කරනුවනට කමටහන් වැඩීම දුෂ්කර බව විසුද්ධිමග්ගය සඳහන් කරයි. මජ්ඣිම භාණක දෙව තෙරණුවෝ මලයරට විසූහයි දක්වේ. මුල්ගිරිගල ගල්ලෙනක '' මජ්ඣිම භාණක උපතිස තෙරහ' යි '' බ්‍රාහ්මී අකුරින් කොටා තිබේ.

**සංයුක්ත භාණකයෝ**

විසුද්ධිමග්ග මනොරථපූරණී යන ග්‍රන්ථ දෙකෙහි සංයුක්ත භාණක චූලසීව හිමි ගැන සඳහන් වෙයි. මෛත්‍රී භාවනාව වැඩීම නිසා විසෙන් අනතුරක් නොවන බවට සංයුත්ත භාණක චූලසීව හිමිගේ නම සඳහන් වෙයි. බ්‍රාහ්මණතිස්ස සාගත කාලයෙහි විසූ මෙම හිමියෝ එකල භික්ෂූන් අතර ප්‍රමුඛත්වයක් දැරූහ.

**අඞ්ගුත්තර භාණකයෝ**

අඞ්ගුත්තර භාණකයන් ගැන අට්ඨකථාවල කොතැනකවත් සඳහන් නොවෙයි ආචාර්‍ය්‍ය අදිකාරම් මහතා කියයි. විසුද්ධිමග්ගයේ බ්‍රහ්මවිහාර නිද්දේසයේ අඞ්ගුත්තර භාණකයන් ගැන සඳහන් වී තිබේ.

**ජාතක භාණකයෝ**

අටුවාව සහිත පන්සිය පනස් ජාතක හදළ භික්ෂූහු ජාතක භාණකයෝය. බුද්ධ කාලයේ සිටි ජාතක භාණක භික්ෂු නමක් ගැන පපංචසූදනිය සඳහන් කරයි. ජාතක භාණක භික්ෂුව අල්පශ්‍රැත යෙකියි මහාතණ්හාසංඛය සූත්‍ර අටුවාවේ එයි. ජාතක දේශනාව ලක්දිව ඉතා ජනප්‍රිය දේශනාවකි

ඉළනාග රජ රුහුණේ සිටියදී තුලාධාර විහාරවාසී ජාතක භාණක මහා පදුම තෙරුන් වෙතින් කපි ජාතකය ඇසුවේය. එයින් පැහැදුනු රජ නාගමහාවිහාරය දිග හැරි දුනු පන්සියයකින් කරවිය. ගාථා දහසකින් යුත් වෙස්සන්තර ජාතකය දීඝවාපී මහාජාතක භාණක තෙරුන් විසින් දේශනා කරනු ලැබෙයයි ඇසූ තිස්ස මහාවිහාරවාසී තරුණ හිමි නමක් එක දිනකින් නව යොදුන් මග ගෙවා දීඝවාපියට වැඩියේයයි මනොරථපූරණිය සඳහන් කරයි.

**ධම්මපද භාණකයෝ**

අටුවා කථා සහිත ධම්මපදය හදාළ භික්ෂූහු ධම්මපද භාණකයෝය. අත්ථසාලිනියෙහි හා වෙනත් කෘති කීපයක ධම්මපද භාණකයන් ගැන කියවේ. උභතො විභඞ්ග භාණක, මහා අරියවංස භාණක, මහාවත්තාළිස භාණක, මහානිද්දෙස භාණක යයි තවත් භාණකයින් කීප දෙනකු ගැන ඉතා විරල වශයෙන් සඳහන් වී තිබේ. බැමිණිටියාසාය සමයේ මහානිද්දේසය කටපාඩම් තිබුනේ එකම භික්ෂුනමකටය. එහෙත් හේ දුස්සීලයෙකි. චතුනිකායික තිස්ස තෙරුන්ගේ උපාධ්‍යාය වූ මහා ත්‍රිපිටක තෙරුන්ගේ බලවත් ඉල්ලීම අනුව මහාරක්ඛිත හිමියෝද පසුව බොහෝ තෙරවරුද එය ඉගෙන ගත්හ. සරභාණක, පදභාණක යයි භාණකයන් දෙකොටසක් ගැනද අටුවාව කියයි. ධර්ම දේශනාවේදී උපයෝගී වන ධර්ම දේශනා අවස්ථා දෙකක් එයින් කියවෙයි.

භාණක සම්ප්‍රදයට අයත් නොවන වෙනත් ක්‍රමයක් අනුව ධර්මය හදාරා ධර්මය ආරක්ෂා කරගත් සම්ප්‍රදාය කීපයක්ද අට්ඨකථාවේ දක්වේ. ඔවුහු නම් : සුත්තන්තිකා, ධම්මධරා, විනයධරා, ආභිධම්මිකා, අට්ඨකථිකා, තෙපිටකා, චතුනිකායිකා යන නම්වලින් උන්වහන්සේ හඳුන්වන ලදහ. සූත්‍රපිටකය දරූ ආචාර්යවරයෝ සුත්තන්තිකයෝය, ධම්මධරයෝද ඔහුය, ධම්මධරාති සුත්ත පිටකධරා'යි මනොරථපූරණියෙහි එයි. විනය පිටකය හදාරා එහි ප්‍රවීණත්වය දරූ ආචාර්යවරු විනයධරයෝය. මහාවිහාරයෙහි විසූ චූලසුමන, උපතිස්ස, ඵුස්සදෙව හිමිවරු විනයධරයෝය. අටුවාචාර්ය බුද්ධඝෝෂ හිමියෝ මහමෙවුනා උයන දකුණුපස පධානඝරයෙහි විසූ බුද්ධමිත්ත තෙරුන් වෙත විනය හදාළහයි කියති.

ආභිධම්මිකයෝ නම්, අභිධර්මය හදාරා එහි ආචාර්යත්වයට පැමිණි තෙරවරුය. භාතිය රාජ සමයේ විසූ ගෝදත්ත හිමි ආභිධම්මික තෙරනමකි. ගෝදත්ත හිමියන් ගැන සමන්තපාසාදිකා විසුද්ධිමග්ග යන ග්‍රන්ථවල සඳහන් වෙයි. ධම්මකථික භික්ෂූහු නම් ආභිධම්මිකයෝම යැයි අත්ථ සාලිනිය කියයි.

නිකාය ග්‍රන්ථ සතර හදාළ භික්ෂූහු චතුනිකායිකයෝය.

අනුරාධපුර යුගයේ මහාවිහාරයෙහි පස් මහසභිය පුහුණු කළ ආචාර්ය මණ්ඩලයක් විය. අධ්‍යාපනය අවසන්කළ භික්ෂූන් ලෝවාමහාපායේ රන්බෙරය ගස්වා පංචනිකාය මණ්ඩලය ඉදිරිපිට පෙනී සිටිය යුතුය. එහිදී තමන්ගේ දැනීම පෙන්නුම් කළ යුතුය. මෙම පංචනිකාය මණ්ඩලය විසින් ආචාර්යවරයන් වෙත අටුවා නොහදාරා පැමිණි ත්‍රිපිටක චූලාභය තෙරුන් පරීක්ෂණයෙන් බැහැර කළ ආකාරය විසුද්ධිමග්ගයේ කම්මට්ඨාන ගහන නිද්දේසයේ සඳහන් වෙයි.

ආචාර්ය බුද්ධඝෝෂ හිමියන් අටුවා කරණයෙහි සමත් බව විසුදධිමග්ගය සම්පාදනයකොට ඉදිරිපත් කිරීමෙන් පැහැදිලිවෙයි. භාණක සම්ප්‍රදායෙන් බුදු දහමේ ආරක්ෂාව හා චිරස්ථිතිය සැලසුනු අන්දම මෙයින් ඉඳුරාම තහවුරු වෙයි.

**ආශ්‍රිත ග්‍රන්ථ :—**


* බුද්ධ ජයන්ති මහාවග්ග පාලියේ ප්‍රස්තාවනාව.
* පැරණි ලක්දිව බෞද්ධ ඉතිහාසය.
* ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගමේ ශාස්ත්‍රීය සංග්‍රහය 1981.


---

කිසිම දෙයක් ලොව තිර නැත හරයක් නැත වෙයි අසරණ
නිවසක් නැත පිහිටක් නැත රජිඳුනි මේ බව දකිමින
රාගය දුරු කළ යුතුමය මෙසසර ගමනට හෙයවන
හරයෙන් තොර කෙසෙල් ගසක් මෙන් සැලකිය යුතු සැබවින

(ආචාර්ය නාගාර්ජුනපාදයන් උදේන රජුට යැවූ සංදේශයකිනි)

---